2. උප්පැන්න සහතික සංශෝධනය

2.1සුදුසුකම්

මවගේ, පියාගේ තොරතුරු, උපන්දිනය, උපන් ස්ථානය, මුත්තාගේ තොරතුරු, දැනුම්දෙන්නාගේ නම වැනි දේ පවතින තොරතුරුවලට වඩා වෙනස් නම් මේ සඳහා ඉල්ලුම් කල හැකිය..

2.2ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය

(ඉල්ලුම්පත් ලබා ගත හැකි ස්ථාන, ඉදිරිපත් කළ යුතු ස්ථානය, කවුන්ටරය හා වේලාවන්)

2.2.1ඉල්ලුම්පත් ලබා ගත හැකි ස්ථාන : ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දී
2.2.2ඉල්ලුම්පත් ලබා ගැනීමට ගෙවිය යුතු ගාස්තු : ගාස්තු ගෙවිය යුතු නැත.
2.2.3ඉදිරිපත් කළ යුතු වේලාවන් : සතියේ වැඩ කරන දින 5 ක දී පෙ.ව.9.00 සිට ප.ව. 2.45දක්වා
2.2.4සේවාව ලබා ගැනීමට ගෙවිය යුතු ගාස්තු : ප්‍රකාශ පත්‍රය සඳහා රජයේ ගාස්තු වන රු.50/=

2.3සේවාව ලබා දීමට ගත වන කාලය (සාමාන්‍ය සේවා හා ප්‍රමුඛ සේවා)

ලිපිගොනුව සකස් කර සම්පූර්ණ කර කුරුණෑගල පිහිටි කලාප කාර්යාලයට යැවිය යුතුය. අනුමත කර ආපසු පැමිණි පසු සංශෝධනය කළ යුතුය.

2.4අවශ්‍ය සනාථ කරන ලියකියවිලි

උප්පැන්න/මරණ සහතිකයක පියාගේ හෝ මවගේ තොරතුරු ඇතුලත් කිරීම/වෙනස් කිරීම සහ උපන් දිනය,උපන් ස්ථානය,ස්ත්‍රී පුරුෂ භාවය,දැනුම් දෙන්නාගේ තොරතුරු වෙනස් කිරීම

අදාල අයදුම්පත
අදාල උප්පැන්නයේ මුල් පිටපත (ප්‍රා.ලේ.කාර්යාලයෙන් ලබාගත්)
ඉල්ලීම් ලිපිය
රෝහල් උපත්/මරණ වාර්තාව හෝ ග්‍රාම නිලධාරීගේ උපත්/මරණ වාර්තාව
ශිෂ්‍ය කාර්ය දර්ශනය හෝ විදුහල්පති තුමාගේ ලිපියක්
හඳහන
මව්පියන්ගේ උප්පැන්නයේ හා විවාහ සහතිකයේ මුල් පිටපත් (ප්‍රා.ලේ.කාර්යාලයෙන් ලබාගත්)
මව්පියන්ගේ ජාතික හැඳුනුම්පත් (සහතික කරන ලද ඡායා පිටපත්)
සහෝදරයන්ගේ උප්පැන්න වල මුල් පිටපත් (ප්‍රා.ලේ.කාර්යාලයෙන් ලබාගත්)
විවාහක නම් විවාහ සහතිකය හා දරුවන්ගේ උප්පැන්න වල මුල් පිටපත් (ප්‍රා.ලේ.කාර්යාලයෙන් ලබාගත්)
ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත (සහතික කරන ලද ඡායා පිටපත)
ඉල්ලුම්කරුගේ පදිංචි සහතිකය (ප්‍රා ලේ කාර්යාලයෙන් අනු අත්සන් කළ යුතුයි)
ඉල්ලුම්කරුගේ දිවිරුම් ප්‍රකාශයක්
අදාල විය යුතු වෙනත් ලිය කියවිලි

2.5සේවා භාර මාණ්ඩලික නිලධාරීන්

තනතුර	නම	අංශය	දුරකථනය	ෆැක්ස්	ඊ - මේල්
අ.දි.රෙ.	ඩබ්ලිව්.ඒ.කේ.එල්.ප්‍රසන්ති	දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්	0372252038	0372252038	ridi_acc@yahoo.com

2.6ව්‍යතිරේක හෙවත් ඉහත අවශ්‍යතා වලින් බැහැර වන අවස්ථා හා විශේෂ තොරතුරු

සංශෝධනයේ ස්වරූපය අනුව සංශෝධනයට අවශ්‍ය වෙනත් ලියවිලි ඇතොත් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් දැනුම් දෙනු ඇත..

2.7ඉල්ලුම්පත් ආකෘතිය (ආකෘති පත්‍රයක් අමුණන්න)
d,e

2.8සම්පූර්ණ කරන ලද ආදර්ශ ඉල්ලුම්පත (සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රයක් අමුණන්න)
සංශෝධනයේ ස්වරූපය අනුව අකෘති පත්‍රය සම්පූර්ණ කරන අයුරු වෙනස් වේ.